**අක්කරෙයිපත්තු මහ නගර සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 04 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින සභාවට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට අක්කරෙයිපත්තු මහ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) වරිපනම් බදු අයකිරීම් සම්බන්ධයෙන් “K” ආකෘතිය ප්‍රකාරව නියමිත වර්ෂයට අදාළ සම්පූර්ණ වරිපනම් බදු මුදල් ජනවාරි 31 දිනට ප්‍රථම ගෙවනු ලැබූ වරිපනම් බදු හිමියන්ට වරිපනම් බද්දෙන් සමාලෝචිත වර්ෂය සඳහා දෙනු ලබන 10% ක වට්ටම් රු.245,253 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) 2005 සිට 2014 දක්වා කාලපරිච්ඡේදය තුළ විවිධ ආයතනවලින් පරිත්‍යාග කරනු ලැබ සභාව විසින් භාවිතා කරනු ලබන ලොරි රථ 03 ක්, ට්‍රැක්ටර් 05 ක්, වතුර බවුසර් 03ක්, JCB යන්ත්‍රයක් සහ ට්‍රැක්ටර් ට්‍රේලර් 05 ක් ආදියෙහි වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) මස්කඩ බදුකරුගෙන් ලැබී තිබූ සමාලෝචිත වර්ෂයට අදාළ බදුවලින් අඩක් වන රු.85,000 ක් තැන්පත් ගිණුමෙන් ආදායම් ගිණුමට මාරුකිරීමට අපොහොසත් වීමෙන් එම වටිනාකමෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ ආදායම් අඩුවෙන් පෙන්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයේ වටිනාකම රු.145,575 ක් වන වර්ග 03 කට අයත් විදුලි තොග අයිතමයන් 384ක්, තොග ගිණුම්වලට ඇතුළත් නොකිරීමෙන් එම වටිනාකමෙන් වර්ෂයට අදාළ හිඟ ආදායම් හා ජංගම වත්කම් අඩුවෙන් පෙන්වා තිබුණි.

### 1.3.2 ලැබිය යුතු ගිණුම්

2012 සහ 2013 වර්ෂවලදී සේවය අත්හිටවූ සහ විශ්‍රාම ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.64,598 ක හිඟ ණය ශේෂය ඔවුන්ගෙන් අයකර ගැනීමට හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට මේ දක්වා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

**1.3.3 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|---|
| | | | රු. | |
| (අ) | නගර සභා ආඥා පනතේ 252 වන පරිච්ඡේදය 218 වගන්තිය | | - | පාලනය සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් සකස් කළ යුතු විස්තරාත්මක වාර්තාව 2017 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර නොතිබුණි. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | (ii) | මුදල් රෙගුලාසි 104 | 535,500 | 2012 වර්ෂයේදී සභාවේ අස්ථානගත වූ පරිගණක සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව අලාභය සඳහා හේතුව සහ අලාභයට වගකිව යුත්තන් සොයා ඔවුන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොතිබුණි. |
| | (i) | මුදල් රෙගුලාසි 165(3) | 45,255 | 2014 වර්ෂයේදී කුකුල් මස් කඩහිමියන්ගෙන් ලැබූ චෙක්පත් 02 ක් තැන්පත් කළ නමුත් බැංකුව විසින් අඟරු කිරීම සම්බන්ධයෙන් සභාව විසින් නියමිත ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| | (iv) | මුදල් රෙගුලාසි 371 | 106,003 | වර්ෂ 06 කට ප්‍රථම සභාවේ සේවකයෙකු හා ප්‍රජා මූල මධ්‍යස්ථානයකට ලබා දී තිබූ අත්තිකාරම් 2 ක් නිරවුල් කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. |
| | (iii) | මුදල් රෙගුලාසි 396 | 5,000 | මාස 06 ක් ඉක්ම වූ නමුත් නිෂ්කාෂණය කිරීමට කටයුතු නොකළ චෙක්පතක් සම්බන්ධයෙන් සභාව විසින් විධිමත් පියවර ගෙන නොතිබුණි. |
| | (v) | මුදල් රෙගුලාසි 571 | 3,595,067 | වර්ෂ 02 සිට වර්ෂ 06 ක් දක්වා කාලයක් කල් ඉකුත් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු 22 ක් සම්බන්ධයෙන් |

මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඇ) නාගරික සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| (i) | 1993 නොවැම්බර් 18 දිනැති අංක 15 දරන චක්‍රලේඛය | - | මහ නගර සභාව විසින් නගර සංවර්ධනය නමින් වූ බැංකු ගිණුමක් ආරම්භ කර සේවා ගාස්තු සහ දඩ ගාස්තු ඉහත ගිණුමට තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | 1989 අප්‍රේල් 29 දිනැති අංක 02/1/10 දරන චක්‍රලේඛය | - | සමාලෝචිත වර්ෂයේ මහනගර සභා බල ප්‍රදේශයේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ඉදිරිපත් කළ අයදුම්පත් 40 ක් සඳහා සෞඛ්‍ය වෛද්‍ය අධිකාරීගේ නිර්දේශ ලබාගැනීමකින් තොරව අනුමත කර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.20,232,252 ක් විය. එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,874,474 ක්ව තිබූ හෙයින් මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,642,222 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

### 2.2 ආදායම් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

ඉදිරිපත් කරනු ලැබූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට සහ පසුගිය වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ආදායම්, ලැයිස්තුගත ආදායම්, අයකළ ආදායම් සහ හිඟ ආදායම් සම්බන්ධයෙන් විස්තර පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම් | ලැයිස්තුගත කළ ආදායම් | අයකළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | ලැයිස්තුගත කළ ආදායම් | අයකළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 10,100 | 10,095 | 5,533 | 25,249 | 10,100 | 10,125 | 6,341 | 20,687 |
| (ii) | කුලී | 15,194 | 14,314 | 12,139 | 15,720 | 14,836 | 13,681 | 11,725 | 13,544 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,650 | 1,751 | 1,751 | - | 1,950 | 2,313 | 2,313 | - |
| (iv) | අනෙකුත් ආදායම් | 10,025 | 14,363 | 14,128 | 14,920 | 9,762 | 11,948 | 9,796 | 14,685 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-----------------------------------------

2017 දෙසැම්බර් 31 දින දක්වා සභාව විසින් අයකර ගතයුතු ආදායම් රු.89,439,165 කින් සමාලෝචිත වර්ෂයේදී රු.33,550,447 ක් අයකර ගෙන තිබුණි. මේ අනුව, ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය 38% ක් වශයෙන් දක්නට ලැබුණි.

**2.2.3 වරිපනම් බදු**

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වරිපනම් බදු අයකිරීම සම්බන්ධයෙන් 2014 ජනවාරි 17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අංක 1846 හි පළකරන ලද දැන්වීම ප්‍රකාරව 2013 දෙසැම්බර් 31 දිනට පැවැති දේපලවලින් වාර්ෂික ඇස්තමේන්තුවෙන් කර්මාන්තශාලාවලට සියයට 18 ක්ද, ව්‍යාපාරික ස්ථානවලට සියයට 14 ක්ද පදිංචි ස්ථානවලට සියයට 10 ක් සහ දුෂ්කර ප්‍රදේශවලට සියයට 05 ක්ද වශයෙන් වර්ෂය සඳහා වරිපනම් බදු අයකළ යුතු වුවත්, සභාව විසින් මේ දක්වා සියළුම ස්ථානවලට සියයට 10 ක් වශයෙන් වරිපනම් බදු තක්සේරු කර අයකරගෙන තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයට අයත් ප්‍රදේශයේ පදිංචි පදිංචිකරුවන් 12,873 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකළ යුතු මුළු එකතුව රු.30,686,921 ක් වූ වරිපනම් බදුවලින් සියයට 18 ක් හෙවත් රු.5,437,782 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයකරගෙන තිබුණි.

**2.2.4 හිඟහිටි බදු අයකිරීම**

-------------------------

1992 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂ අවසාන දිනය දක්වා අයකරගත යුතු හිඟ බදු රු.14,014,705 කින් 50% ක් හෙවත් රු.7,046,200 ක හිඟ බදු මුදල් පමණක් අයකරගෙන තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කළමනාකරණ දුර්වලතා**

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහනගර සභාව විසින් කාය වර්ධන වැඩසටහන යටතේ 2015 වර්ෂයේ සිට කාය වර්ධන මධ්‍යස්ථානයක් ආරම්භ කර පවත්වාගෙන ගොස් තිබුණත් එය ප්‍රයෝජනයට ගනු ලබන සාමාජිකයන්ගේ අවශ්‍යතාවයන්ට සුදුසු ආකාරයෙන් වන නවීන කාය වර්ධන යන්ත්‍ර සපයා දී සභාවේ ආදායම් ඉහළ නංවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන මුදල් පොත අනුව, බැංකු ජංගම ගිණුමේ 2017 ජනවාරි මාසයේ සිට සමාලෝචිත වර්ෂ අවසානය දක්වා එක් එක් මාසය අවසානයේ රු.මිලියන 15.3 සිට රු.මිලියන 18.9 ක් දක්වා වන පරාසයකින් අත ඉතිරි මුදල් දක්නට ලැබුණි. මෙය ආදායම් උපදවිය හැකි ආකාරයේ තැන්පතුවල ආයෝජනය කිරීමට සභාව කටයුතු නොකිරීම හේතුවෙන් ආසන්න වශයෙන් රු.1,500,000 ක ආදායම් සමාලෝචිත වර්ෂයේ අහිමි වී තිබුණි.

(ඇ) මහ නගර සභාව විසින් කුලියට දෙනු ලබන කඩ කාමරවලින්, කඩ කාමර 25 ක් සඳහා විදුලිය ගාස්තු කඩකාමර කුලියට ගනු ලබන අය විසින් ගෙවිය යුතු බවට ඔවුන්ගේ ගිවිසුම්වල සඳහන් කර තිබුණත්, 2017 වර්ෂයේ සිට 2018 අගෝස්තු 30 දින දක්වා වන විදුලිය ගාස්තු රු. 125,760 ක් සභාවේ අරමුදලින් ගෙවා තිබුණි.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේදී ගිනි නිවීමේ ඒකකයක් ආරම්භ කිරීම වෙනුවෙන් රු.87,400,000 ක් වටිනා වාහන 04 ක් මහ නගර සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබූ නමුත්, මෙම ඒකකය සඳහා අනුමත කරනු ලැබූ සේවකයින් 24 දෙනෙකු අනුයුක්ත කර මෙම ඒකකය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ සිට සභාව විසින් අනුමත කරනු ලැබූ නිලධාරීන්ගෙන් නිලධාරීන් 55 දෙනෙකුගේ පුරප්පාඩු පුරවා නොතිබීමෙන් එම තනතුරුවලට අදාළ කාර්යයන් කරගෙන යාමේ දුෂ්කරතා නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ පාලන අංශයේ සේවය කරනු ලබන නිලධාරීන් 06 දෙනෙකු සඳහා වන කාර්යභාරයන් ලබා නොදීම නිසා ඔවුන්ගේ කාර්යභාරයන් වෙනස් වී තිබුණි.

(ඈ) සභාවේ සැලසුම් අංශයේ සේවය කරනු ලබන තාක්ෂණ නිලධාරීන්ගේ රාජකාරී විධිමත් ආකාරයෙන් අධීක්ෂණය කරනු ලැබූ බවට සනාථ කළ හැකි ලේඛන ක්ෂේත්‍ර රාජකාරී ලේඛන, දෛනික රාජකාරී විස්තර (Diary Extract) සහ පූර්ව වැඩසටහන් න්‍යාය පත්‍රය(Advance Programme) ආදිය පිළියෙල කර අනුමත කරගෙන නොතිබුණි.

**3.3 නිෂ්කාර්ය වත්කම්**

**----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහනගර සභාවට අයත් කඩකාමර 107 ක් කුලියට ලබා නොදී 2014 වර්ෂයේ සිට මේ දක්වා වසා දමා තිබුණු අතර, කඩ කාමර කුලියට ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මෙතෙක් ගෙන නොතිබුණි.

(ආ) 2014 සහ 2015 කාලපරිච්ඡේදය තුළ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් මහනගර සභාවේ පුස්තකාල වෙනුවෙන් ලබාදෙනු ලැබූ රු.මිලියන 13.69 ක් වටිනා ලී බඩු හා සවිකිරීම් 2017 සැප්තැම්බර් 30 දින වන විටත් අදාළ අරමුණු සඳහා යොදා නොගෙන පුස්තකාල පරිශ්‍රයේ නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) අලුත්වැඩියා කර භාවිතා කළ හැකි තත්ත්වයේ පැවති ට්‍රැක්ටර් 06 ක්, ට්‍රැක්ටර් ට්‍රේලර් 02 ක්, ඩබල් කැබ් රථ 01 ක් සහ එක්ස්කැවේටර් 01 ක් ඇතුළු වාහන 10 ක් අලුත්වැඩියා කිරීමට පියවර නොගෙන වර්ෂ 04 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

**5. පද්ධති හා පාලන**

**--------------------**

පහත දැක්වෙන එක් එක් ක්ෂේත්‍ර හා ඒ ඉදිරියේ දක්වා ඇති කරුණු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | පාලන ක්ෂේත්‍රය | | අවධානය යොමු කළ යුතු කරුණු |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම. |
| | | (ii) | සභාව විසින් භාවිතයට ගනු නොලබන නිෂ්කාර්යව පවතින ස්ථාවර වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) | ආදායම් අයකිරීම් කළමනාකරණය | | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | | ඝන අපද්‍රව්‍ය වෙන්කර එකතු කිරීම. |